## කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
## ශාස්ත්‍රවේදී පළමුවන වසර පරීක්ෂණය
## පළමු සෙමෙස්තරය - 2018/2019
## FND 1104 - කලාව හා සංස්කෘතිය පිළිබඳ ගැටලු
(පැ දෙකයි)

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

01 පහත සඳහන් ගීතය පිළිබඳ විචාරාත්මක විවරණයක යෙදෙන්න.

අන්දර යායේ වැව් තාවුල්ලේ
සක්මන් කරනා අප්පච්චී
දොළේ දියයි මට කෙතේ නිලයි
ගහ වැලේ මලයි මට අප්පච්චී

වලාකුළේ ඩා බිඳු තවරා
මහ පොළවට මහ වැසි ගෙනෙනා
දිසි ගමනේ ඉම කඳු මුඳුණේ ඉඳ
පිතු සෙනෙහේ කඳුළැලි සලනා

තුරු හිස මුදුනේ මල් පළඳා
කැකුළු මුවට පලවැල නෙලුවා
ඒ දඬු මං බැඳ සත්කුළු පව් බිඳ
සිදාදියට එන මං තැනුවා

02 සඳ නොනැගෙන රාත්‍රියට
සඳ ගෙන එයි
මල් නොපිපුණු උයන පුරා
මල් පුබුදයි.

මෙම කාව්‍ය කොටස පිළිබඳ සාහිත්‍යයික විග්‍රහයක් කරමින් කලාවෙන් සාක්ෂාත් කර ගන්නා අරමුණු කවරේදැයි විමසන්න.

03 සාම්ප්‍රදායික සහ නූතන සිංහල සමාජයේ කාන්තාව අතර ඇති වෙනස්කම් කවරේදැයි ඔබ කැමති කලා නිර්මාණ දෙකක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

04. ජන කාව්‍යය මගින් පැරණි සමාජය ඉටු කර ගන්නට උත්සුක වූ අරමුණු කවරේදැයි නිදර්ශනාත්මක විග්‍රහයක යෙදෙන්න.

05. යහපත් දේශයක කාන්තාව සතු වගකීම් කවරේදැයි **යසෝදරාවත** ජන කාව්‍යය විමසමින් සාකච්ඡා කරන්න.

06. නූතන ශ්‍රී ලංකා සමාජයේ දරුවන් හා පියවරුන් අතරෙහි ඇති දුරස්ථ බව සමාජීය අර්බුදයක් ලෙස විග්‍රහ කළ හැකිදැයි **පියසමර** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

**********************